## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

### අන්තර්මධ්‍ය විභාගය - ජූලි 2014

## (55) තොරතුරු කළමනාකරණය හා ව්‍යාපාරික භාවිතය
(Information Management & Application in Business)

---

ළමුන්ගේ ප්‍රායෝගික දැනුම ඉලක්ක කර සාදන ලද ප්‍රශ්න පත්‍රයක් ලෙස මෙවර ප්‍රශ්න පත්‍රය දැක්විය හැක. මේ කාල වකවානුවේ බොහෝ සිසුන් තමාගේ තාක්ෂණික දැනුම ප්‍රායෝගික මට්ටමින් වැඩි දියුණු කර ගන්නා වකවානුවක මෙවන් ප්‍රශ්න පත්‍රයක් දැමීම ඉතාමත් කාලෝචිතය. පළමු ප්‍රශ්නය වෙනුවෙන් මුළු ලකුණු සියල්ලම (40) ලබාගත් සිසුන් ඉතාමත් අල්ප වුවත් මධ්‍යම මට්ටමේ ලකුණු 30 ට වැඩියෙන් ලබාගත් ළමුන් බොහෝ ප්‍රමාණයක් විය.

ප්‍රශ්න අතහැර දැමීමේදී ප්‍රශ්න අංක 05 හා ප්‍රශ්න අංක 06 සිසුන් විසින් අතහැර දමා තිබුණි. ප්‍රශ්න අංක 05 සිසුන්ගෙන් 71% ක ප්‍රමාණයක්ද, ප්‍රශ්න අංක 06 සිසුන්ගෙන් 62% ක ප්‍රමාණයක් ද ලෙස ඉතා විශාල සංඛ්‍යාවක් අතහැර දමා තිබුණි. ප්‍රශ්න අංක 03 මුළු සිසුන්ගෙන් 46% ක් පමණ අතහැර දමා තිබුණු බව පෙණුනි.

## A - කොටස

**බහුවරණ ප්‍රශ්න**

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි.)**

කොටස් 20 කින් සමන්විත වූ බහුවරණ ප්‍රශ්න සහිත මෙම ප්‍රශ්නය ඉතාමත් ප්‍රායෝගික වූ ප්‍රශ්නවලින් සමන්විතව සාදා තිබුණි. තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාරික භාවිතය එක් ව ඇතිවන ගැටළු හා සම්බන්ධව දැනුම පිරික්සා තිබුණි. ළමුන් බොහොමයක් ලකුණු 26 කට වැඩියෙන් ලබාගෙන තිබුණි.

## B - කොටස

**ප්‍රශ්න අංක 02 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

මෙය ප්‍රශ්න අංක 02 සිට 07 දක්වා තෝරා ගත හැකි ප්‍රශ්න 06 න් එකකි. (a), (b), (c) හා (d) ලෙස මෙම ප්‍රශ්නය කොටස් 4 කින් යුක්තය. සමස්ථයක් ලෙස සැළකීමේ දී මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලියූ සිසුන්ගෙන් 99 % ආසන්න පිරිසක් මෙම ප්‍රශ්නයට උත්සාහ දරා තිබුණි. එම සිසුන්ගෙන් 75 % පමණ ලකුණු 10 කට ආසන්න ලකුණු ලබා තිබුණි.

(a) මෙම කොටසින් අසා ඇත්තේ “තොරතුරු” යන්න අර්ථ දක්වන ලෙසය. මෙම ප්‍රශ්නය ඉතා සුපුරුදු එකකි. සිසුන්ගෙන් විශාල පිරිසක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. නමුත් සුළු පිරිසක් විභාගයට පෙර අවශ්‍ය මූලික අර්ථ දැක්වීම් පිළිබඳවත් අවධානය යොමු කොට නොතිබිණි.

(b) දත්ත සැකසීමේ ක්‍රියාවලිය දැක්වෙන රූප සටහනක් මෙම කොටසේ දී ඇඳීම කළ යුතු වුවත් බොහෝ සිසුන් එය සම්පූර්ණ කර නොතිබිණි. ඉතා සුපුරුදු ප්‍රශ්නයක් වුවත් මෙහිදී දත්ත ඇතුළත් කිරීම, සැකසීම හා පිටවීම සම්බන්ධ නිවැරදි පිළිවෙල දැක්වීමද වැදගත් විය. එය ඊ හිස (arrow) ඇඳිය යුතු පිළිවෙලද මෙහිදී වැදගත් වේ.

(c) කොටසින් අසා ඇත්තේ ප්‍රාථමික පාසලක් (A primary school) හා ගමක සිල්ලර වෙළෙඳසළක් (A retail shop in a village) යන අවස්ථා දෙක සඳහා වූ තොරතුරු පද්ධතියක ගබඩා කරනු ලබන තොරතුරු වර්ග 03 බැගින් වූ ලැයිස්තුවකි. මෙම කොටසට ලකුණු 06 ක් හිමි විය. එහිදී එක් තොරතුරක් සඳහා එක් ලකුණ බැගින් අවස්ථා දෙකේ තොරතුරු 6 සඳහා ලකුණු 06 ලෙසය.

සමස්ථයක් ලෙස සිසුන් මෙම කොටසට සාර්ථකව පිළිතුරු ලියා නොතිබිණි. එහිදී තොරතුරු වර්ග තුනක් වෙනුවට එකම තොරතුරු වර්ගයේ ක්ෂේත්‍ර (fields) ලියා තිබුණි. උදාහරණයක් ලෙස සිසුන්ගේ පෞද්ගලික තොරතුරු යන එක් වර්ගය සඳහා එහි අඩංගු සිසුන්ගේ නම්, සිසුන්ගේ ඇතුළත් වීමේ අංක, සිසුන්ගේ උපන්දින, ............. ආදිය දක්වා තිබුණි. මෙහිදී සිසුන් පාසලේ ඇති මානව සම්පත් හා භෞතික සම්පත් වෙන්කොට හඳුනාගෙන ඒවාට අදාළ තොරතුරු වර්ග දැක්වූයේ නම් පිළිතුර වඩා සාර්ථක වනු ඇත.

ගමක සිල්ලර වෙළඳසැලේ තොරතුරු වර්ග සැළකීමේදී බොහෝ සිසුන් යම් තරමක් සාර්ථකව පිළිතුරු ලියා තිබුණි.

(d) කොටසින් අසා ඇත්තේ උපක්‍රමික තොරතුරුවල (Strategic information) ලක්ෂණ තුනක් වුවත් බොහෝ සිසුන් උපක්‍රමික තොරතුරු යන්න නොසලකා පොදුවේ තොරතුරු වල අඩංගු සාමාන්‍ය ලක්ෂණ දක්වා තිබුණි. ඔවුන් මෙම කොටසින් බලාපොරොත්තු වන උපක්‍රමික තොරතුරු යන්න සළකා නැත.

සමස්ථයක් ලෙස මෙම ප්‍රශ්නයට සිසුන් සාර්ථකව පිළිතුරු ලියා තිබුණි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

**(1) ප්‍රශ්නයෙන් අසා ඇති දේ -**
මෙම ප්‍රශ්නයෙන් මෙහෙයුම් පාලන පද්ධති, ගනුදෙනු සැකසුම් පද්ධති සහ තීරණ ආධාරක පද්ධති පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබුණි.

**(2) පිළිතුරු සැපයීම පිළිබඳව -**

පිළිතුරු ලියා ඇති සිසුන්ගෙන් 50% කටත් වැඩි ප්‍රමාණයක් මුළු ලකුණු ප්‍රමාණයෙන්, 8 කට අඩු ප්‍රමාණයක් ලබාගෙන ඇත. (c) කොටස සඳහා ලකුණු ලබාගත්තේ ඉතාම සුළු පිරිසකි. අනිත් කොටස් වලට ද බලාපොරොත්තු වන පිළිතුර බොහෝ විට නොතිබුණි.

**(3) පිළිතුර පිළිබඳව සෑහීමට පත්නොවීමට හේතුව -**

පිළිතුරු ලියා ඇති ප්‍රමාණය සහ ලකුණු ලබාගත් ප්‍රමාණය පිළිබඳව සතුටු විය නොහැක. තොරතුරු පද්ධති වර්ග පිළිබඳ දැනුම අඩු බවක් පෙන්නුම් කරන අතර ප්‍රශ්නය තේරුම් ගැනීමේ දුර්වලතාවයක් ද පෙන්නුම් කරයි. Study pack, test book හා ගුරුවරයා ලබාදුන් සටහන් කටපාඩම් කර සියලුම දේ පිළිතුරු ලියන බවක් පෙනේ. ප්‍රශ්නයෙන් අසන දේ තේරුම් ගෙන නොමැත.

**(4) පිළිතුරු ලිවීමේ හැකියාව වර්ධනය කිරීමට කළ යුතු දේ -**

සිසුන්ට තොරතුරු පද්ධතිවල භාවිතයන් පිළිබඳව ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් දැනුවත් කිරීම කළ යුතුයි. එමගින් සිසුන් නිර්මාණාත්මක පිලිතුරු ලිවීම සඳහා පුහුණු කළ හැක. ගුරුවරුන් විසින් කල යුත්තේ සිසුන්ගේ නිර්මාණාත්මක හැකියාවන් දියුණු කිරීම සඳහා කටයුතු කිරීමයි.

පිළිතුරු ලිවීමේ දී අදාළ පිළිතුර කෙටියෙන් ලිවීමට හුරු කළ යුතුය. අනවශ්‍ය පරිදි විස්තරාත්මකව පිළිතුරු ලිවීමට උත්සාහ කිරීමේ දී කාල කළමනාකරණ ගැටළු මතු විය හැකිය.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

(1) **ප්‍රශ්නයෙන් අසා ඇති දේ -**

(a) ප්ලාස්ටික් පුටු නිපදවන ආයතනයක කළමනාකාර අධ්‍යක්ෂ හා තත්වපාලක අධීක්ෂක විසින් භාවිතා කරන තොරතුරු 2 බැගින්

(b) පරිගණකයට අදාළව නිර්වචණයෙන් කුමක් අදහස් කරන්නේද යන්න

(c) තොරතුරු පද්ධතිවලට මිනිසා විසින් සිදු කරන ආපදා

(d) ආපදා ප්‍රතිසාධන සැලසුමක ඉතාමක් වැදගත් පැතිකඩවලින් එකක් වනුයේ අඛණ්ඩභාවයයි, උත්තරය සාධාරණීකරණය කරන්න.

(2) **පිළිතුරු සැපයීම පිළිබඳව -**

ශිෂ්‍යාන්ගෙන් 80% ක් පමණ ලකුණු 10 ට වැඩියෙන් ලබාගෙන ඇත.

(3) **පිළිතුර පිළිබඳව සෑහීමට පත්නොවීමට හේතුව -**

(d) සිසුන් බොහොමයක් (a) කොටසේ දී ඇති තනතුරු දෙක තේරුම් නොගෙන පොදුවේ භාවිත වන තොරතුරු විස්තර කර තිබුණි. එක් එක් තනතුර අනුව අවශ්‍ය වන තොරතුරු වෙනස් බව සිසුන් අවබෝධ කරගත යුතුවේ.

(i) එනම්, (d) කොටසින් ආයනයේ මුළු දේපළවලට ආරක්ෂාව සඳහා ආපදා ප්‍රතිසාදන සැලස්මක් අවශ්‍ය බව. මෙහිදී බොහෝ සිසුන් තමන්ගේ පිළිතුර සාධාරණීකරණය කර නොතිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

(1) **ප්‍රශ්නයෙන් අසා ඇති දේ -**

(a) යන්ත්‍ර භාෂාව යනු කුමක් දැයි විමසා තිබුණි

(b) පරිගණක මෘදුකාංග පොදි / කට්ටලයක් යනු කුමක්දැයි හැඳින්වීමට සහ ඉන් එකක් නම් කිරීම.

(c) අන්තර්ජාල මූලික හා පුද්ගල මූලික ඊමේල් යනු කුමක්දැයි හැඳින්වීම හා උදාහරණ 2 බැගින් නම් කිරීම.

(d) භාවිතයෙන් ඉවත් කර ඇති මෙහෙයුම් පද්ධතිය නම් කිරීම හා ඒ වෙනුවට ගත හැකි විකල්ප ක්‍රියාමාර්ගයක් නම් කිරීම.

(2) **පිළිතුරු සැපයීම පිළිබඳව -**

මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමට උත්සාහ දරා තිබුණේ සමස්ත සිසුන් ප්‍රමාණයෙන් 25 % ක් පමණ ප්‍රමාණයකි. මෙම ප්‍රශ්නය පරිගණක භාවිතයේ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගික භාවිතයේ දී කෙසේ ද යන්න ඉතාමත් හොඳින් විදහා දැක්වෙන ප්‍රශ්නයකි.

(b) 60 % පමණ නිවැරදිව පිළිතුරු සපයා තිබූ අතර, **මෘදුකාංග පොදි** යන්න පැහැදිලි කර තිබූ අතර වැඩිදෙනෙකු උදාහරණය පමණක් නිවැරදිව දක්වා තිබුණි.MS Office ලෙස කෙළින්ම පිළිතුරු නොලියා Microsoft Word, Access, Excel, PowerPointආදී ලෙස පිළිතුරු සටහන් කර තිබුණි.

(c) 50% පමණ නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. Web based Email සඳහා උදාහරණ සහිතව නිවැරදිව පිළිතුරු උදාහරණද සහිතව දක්වා තිබුණි. එහෙත් standalone යන්න අවබෝධ කරගැනීමට උත්සාහ දරා නැත. පිළිතුරු ලෙස බොහෝ අය තමන්ගේ ඊමේල් ලිපිනය දක්වා තිබුණි.

(d) බොහෝ දෙනෙකු පිළිතුරු දැන නොසිටිය බව දැක්විය හැක. විසඳුම ලෙස වෙනත් මෙහෙයුම් පද්ධතියකට මාරුවීම පමණක් දක්වා තිබුණි.

සමස්ථයක් ලෙස දැක්වීමේ දී බොහෝ දෙනෙකු අඩුවෙන් තොරාගෙන තිබූ ප්‍රශ්නයකි.

**ප්‍රශ්න අංක 06 - ලකුණු** 15
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

(1) **පරීක්ෂා කළේ,**

(a) පැතුරුම්පත් මෘදුකාංග වල තිබෙන අංග 03 ක ඉටුකරන කාර්යයන්

(i) ශ්‍රිතය

(ii) සූත්‍රය

(iii) වැඩ පත්‍රිකාව

(b) තොරතුරු පද්ධතිවල භාවිත ආකාරයට “දත්ත පදනම “ සහ “දත්ත ආයචන ගබඩාව “ යන පද අතර ඇති වෙනස

(c) පද්ධති සංවර්ධන ජීවන චක්‍රයෙහි පියවර සහ කාර්යයන් ගලායන රූප සටහන

(2) **පිළිතුරු සැපයීම පිළිබඳව -**

(a) මෙම කොටස සඳහා පිළිතුරු ලියා තිබූ සියලුම අපේක්ෂකයන් කොටස් 03ටම පිළිතුරු සපයා තිබුණි.

(b) මෙම කොටසට නිවැරදි පිළිතුරු ලියූ අපේක්ෂකයන් ප්‍රමාණය අඩුය.

(c) පිළිතුරු ලියූ අපේක්ෂකයන් වැඩි පිරිසක් මෙම කොටසටද පිළිතුරු සපයා තිබුණි.

(3) **සැහීමකට පත් නොවූ අවස්ථා -**

(a) සමහර සිසුන් ශ්‍රිතය, සූත්‍රය සහ වැඩ පත්‍රිකා යනාදිය මගින් ඉටුකරන දේ පැහැදිලිව හඳුනාගෙන නොතිබුණි.

(b) මෙම කොටස සඳහා පිළිතුරු ලියා තිබුණු අපේක්ෂකයන් ප්‍රමාණය අඩු අතර ලියා තිබුණු පිළිතුරු ද බෙහෙවින් නැවැරදි නොවීය..

(c) කොටස සඳහා බොහෝ අපේක්ෂකයන් පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ රූපසටහන නිවැරදිව ඇඳ නොතිබිණි.

**ප්‍රශ්න අංක 07 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

(1) **පරීක්ෂා කළේ,**

සාමාජීය ජාල, තොරතුරු පද්ධති පාලන වර්ග සහ ගිනිවැට (ෆයර්වෝල්) සම්බන්ධවයි. මෙය බාහිර දැනුම සහ ස්ව අධ්‍යයන කට්ටලය දෙකේම දැනුම සම්බන්ධව යෙදුනු ප්‍රශ්නයකි.

(2) **ප්‍රගතිය**

සියලුම සිසුන් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමට උත්සාහ දරා ඇත. ඉන් බොහෝමයක් 7-8 ලකුණු ලබා ඇත.

(3) **සැහීමකට පත් නොවූ අවස්ථා -**

(a) (i) බලාපොරොත්තු වූ පිළිතුර ලබා දී තිබුණේ ඉතා සුළු පිරිසක් පමණි.

වැඩිපුර තිබූ වැරදි පිළිතුරු

- පවුලේ විස්තර, සාමාජීය තොරතුරු, පුද්ගලික තොරතුරු

(ii) වැඩි පිරිසක් හොඳින් ලියා තිබුණද, වැඩි ප්‍රමාණයක් සාමාන්‍ය අන්තර්ජාල වල වාසි ලියා ඇත.

(iii) පාවිච්චිය නවතා දැමීම, වයස් සීමා පැනවීම, ආදී පිළිතුරු දී තිබුණි.

(b) 50% ළමුන් කිසිම පිළිතුරක් සපයා නැත. පිළිතුරු සැපයූ අයගෙන් 90 % පමණ වැරදි පිළිතුරු සපයා තිබුණි. නිවැරදිව ලියා තිබුණේ කිහිප දෙනෙක් පමණි.

(c) 75% ළමුන් ලියා ඇත්තේ වෛරස් නැවැත්වීම බවයි. රූපසටහන ඇඳ තිබුණේ ඉතාම සීමිත පිරිසක් පමණි. දී තිබූ වැරදි පිළිතුරු අතර පහත ඒවාද බහුල වි.

- විදුලි කෙටීම්වලින් ආරක්ෂා කරගැනීම
- දිගුකලක් පාවිච්චියේදී එකතුවන තාපයෙන් ආරක්ෂා කිරීමට

(4) **පිළිතුරුලිවීමේ හැකියාව වර්ධනය කිරීමට කළ යුතු දේ -**

තොරතුරු තාක්ෂණය පිළිබඳ බාහිර දැනුම ලබා ගත යුතුය. එසේ නොමැතිව facebook ගැන අසා ඇති දේ ලිවීමෙන් පමණක් ලකුණු ලබා ගත නොහැකිය.

අනෙක් කොටසට firewall පිළිබඳව විස්තර දැන සිටීම අවශ්‍යය. වැඩි පිරිසක් firewall නොදන්නා බව පෙනි යයි.

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීම සඳහා සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

1. පිළිතුරු සැපයීමට පෙර ප්‍රශ්නය හොඳින් කියවා නිවැරදිව වටහාගෙන අසා ඇති දෙයට පමණක් පිළිතුරු සැපයිය යුතුය.

2. සිසුන්ට එක් එක් ක්ෂේත්‍රවල තාක්ෂණික වචන පිළිබඳව හා ඒවායේ වෙනස්කම් පිළිබඳ මනා වැටහීමක් තිබිය යුතුය.

3. තොරතුරු තාක්ෂණය සම්බන්ධ ගැටළු වලට පිළිතුරු ලිවීමේදී අළුතින් නිකුත් කරන සඟරා, පුවත්පත්, අත්පොත්, පාඨ ග්‍රන්ථ හා අන්තර්ජාලය හොඳින් පරිශීලනය කර නිරන්තරයෙන් අධ්‍යයනය කළ යුතු වේ

4. විශේෂයෙන් තොරතුරු තාක්ෂණයේ නව ප්‍රවණතා සම්බන්ධව දැනුම යාවත්කාලීන කර ගැනීම.

5. තොරතුරු තාක්ෂණයේ න්‍යායාත්මක කරුණු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන ආකාරය පැහැදිලිව දැන සිටීම.

6. විශේෂයෙන්ම, බහුවරණ කොටස සඳහා පිළිතුරු සැපයීමේදී නිවැරදි ප්‍රශ්න අංක (ඉංග්‍රීසි අක්ෂරයන්) පිළිවෙලින් උත්තර පොතේ සඳහන් කර එම ප්‍රශ්න වල උත්තරයන්ට අදාල ඉලක්කම පැහැදිලිව දැක්විය යුතුය (අනුපිළිවෙලට A සිට T දක්වා ප්‍රශ්න අංක යෙදීම).

7. අළුත් ප්‍රශ්නයක් අළුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

8. අත් අකුරු පැහැදිලිව ලිවිය යුතුය.

9. උත්තර පත්‍ර භාර දීමට පෙර විභාග ශාලාවේදී ප්‍රශ්න අංක හා තමන්ගේ විභාග අංකය නිසිපරිදි යොදා ඇත්දැයි පරීක්ෂා කර බැලීම.

10. විභාගයට පෙර සූදානමක් සහිතව පසුගිය ප්‍රශ්නපත්‍ර පරිශීලනය කිරීම හා ඒජ්ටී ආයතනය නිකුත් කර ඇති ස්වඅධ්‍යයන පාඩම්මාලා පොත (Study Pack) හොඳින් අධ්‍යයනය කිරීම.

- * * * -